# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2026 ජූනි මස 05 වන දින**

**II වන කොටස**

## අතිරේකය

(2026.06.05 දින නිකුත් කරන ලදී)

## ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය

**මාධ්‍ය වෘත්තිකයන් සඳහා වෘත්තීමය ප්‍රමිති හඳුන්වා දීමේ සහ පවත්වාගෙන යාමේ අරමුණින් ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 87.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය

එල්.ඩී.-ඕ 25/2025

**මාධ්‍ය වෘත්තිකයන් සඳහා වෘත්තීමය ප්‍රමිති හඳුන්වා දීමේ සහ පවත්වාගෙන යාමේ අරමුණින් ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය*

**1.** (1) මේ පනත 2026 අංක     දරන ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් නියම කරනු ලැබිය හැකි පරිදි (මේ පනතේ “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

### I වන කොටස

### ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම

*ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම*

**2.** (1) (මේ පනතේ “ආයතනය” යනුවෙන් සඳහන් කරනු ලබන) “ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය” යයි කියනු සහ හඳුන්වනු ලැබිය යුතු ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආයතනය, (1) වන උපවගන්තිය මඟින් එයට පවරා ඇති නාමයෙන්, සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් පැවතිය යුතු අතර, එකී නාමයෙන් එම සංස්ථාපිත මණ්ඩලය විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

PL 15758 - 465 (2026/05)

ආයතනයේ පරමාර්ථ

**3.** ආයතනයේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) මාධ්‍ය ක්ෂේත්‍රය තුළ මාධ්‍ය වෘත්තිකයන් වෙනුවෙන් වෘත්තිමය සංවිධානයක් ලෙස ක්‍රියා කිරීම;

(ආ) ආයතනයේ සාමාජිකයන් වීමට අවශ්‍ය සුදුසුකම් ලබා ඇති මාධ්‍ය වෘත්තිකයන් බඳවා ගැනීම;

(ඇ) ආයතනයේ සාමාජිකයන්ට සහ ශිෂ්‍යයන්ට මාධ්‍ය විෂයය පිළිබඳ ඉගැන්වීම සහ පුහුණු කිරීම;

(ඈ) ආයතනයේ සාමාජිකයන්ගේ සහ ශිෂ්‍යයන්ගේ මෙන්ම මාධ්‍ය වෘත්තිකයන්ගේ ද කුසලතාවල සහ ප්‍රායෝගික පුහුණු ක්‍රියාකාරකම්වල ප්‍රමිති වැඩි දියුණු කිරීම;

(ඉ) ආචාර ධර්ම සංග්‍රහයට අනුව ආයතනයේ සාමාජිකයන් සහ ශිෂ්‍යයන් අතර වෘත්තීමය විනය පවත්වාගෙන යාම;

(ඊ) නව ගෝලීය සන්නිවේදනය සහ මාධ්‍ය ප්‍රවණතා වර්ධනය කිරීමට සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම පිණිස මාධ්‍ය ක්ෂේත්‍රය තුළ පර්යේෂණ පැවැත්වීම;

(උ) මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සම්මේලන පැවැත්වීම සහ ජර්නල් සහ සඟරා පළ කිරීම;

(ඌ) ශ්‍රී ලංකාව තුළ වඩාත් හොඳ වෘත්තිමය මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම පිණිස ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි මාධ්‍ය ක්ෂේත්‍රයේ ආයතන සමඟ සහයෝගීතාවයෙන් මාධ්‍යට අදාළ අධ්‍යාපන, පුහුණු කිරීම් සහ ශිෂ්‍යත්ව වැඩසටහන් හුවමාරු කර ගැනීම;

(එ) මාධ්‍ය වෘත්තිකයන්ගේ කාර්යක්ෂමතාවය ඇගයීමේ දී මාධ්‍ය වෘත්තීයභාවයෙන් යුත් මාධ්‍ය වෘත්තිකයන් පිළිගැනීමට ලක්කිරීම; සහ

(ඒ) ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීමට ආනුෂංගික වන හෝ උපකාරී වන සියලු ක්‍රියා සහ දේවල් සිදු කිරීම.

ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, ආයතනයට-

(අ) ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය අධ්‍යාපනය සහ මාධ්‍ය වෘත්තීයභාවය වැඩිදියුණු කිරීම අරමුණු කරනු ලබන යම් සැලසුමක්, වැඩසටහනක් හෝ ක්‍රියාකාරකමක් පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම;

(ආ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා නිශ්චය කිරීම;

(ඇ) ආයතනයේ ශිෂ්‍යයන්ව ලියාපදිංචි කිරීම සහ බඳවා ගැනීම නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම, එකී ශිෂ්‍යයන් විෂයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඊට ආනුෂංගික වෙනත් යම් කාරණාවක් සිදු කිරීම;

(ඈ) ප්‍රායෝගික පුහුණු පාඨමාලා වැඩපිළිවෙළ නිශ්චය කිරීම සහ අනුමත කිරීම සහ එවැනි පාඨමාලා පැවැත්වීම;

(ඉ) ආයතනයේ සාමාජිකත්වය සඳහා යෝග්‍යතා විභාග පැවැත්වීම;

(ඊ) ආයතනයේ සාමාජිකයන්ගේ, මාධ්‍ය වෘත්තිකයන්ගේ, ආයතනයේ ශිෂ්‍යයන්ගේ සහ මාධ්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන තැනැත්තන්ගේ භාවිතය සඳහා පුස්තකාල පවත්වාගෙන යාම;

(උ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන වැඩසටහන්වල විශිෂ්ටත්වයන් දක්වා ඇති තැනැත්තන් සඳහා ශිෂ්‍යත්ව, සම්මාන සහ ත්‍යාග ප්‍රදානය කිරීම;

(ඍ) ආයතනයේ නිලධරයන් සහ සේවානියුක්තයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම, ආයතනය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ආයතනයේ නිලධරයන් සහ සේවානියුක්තයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(එ) ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම උදෙසා ආයතනයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවානියුක්තයන් පුහුණු කිරීම;

(ඒ) ආයතනයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රැස්වීම්, දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම;

(ඔ) සභාවේ මහා සභා රැස්වීමක දී නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, 5 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සභාව විසින් ආයතනය සඳහා අවශ්‍ය විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම, ආයතනයට අයත් යම් චංචල හෝ නිශ්චල දේපළ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය හෝ විකිණීම හෝ නැතහොත් ඒවා බැහැර කිරීම;

(ඕ) යම් රාජ්‍ය බැංකුවක ජංගම, ඉතිරි කිරීමේ හෝ වෙනත් තැන්පතු ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාම සහ අවශ්‍ය පරිදි එකී ගිණුම් වසා දැමීම;

(ක) ආයතනයේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන්නා වූ ආයතනයේ අරමුදල් ආයතනයේ යම් බැංකු ගිණුමක හෝ ආයතනයේ ගිණුම්වල තැන්පත් කිරීම;

(ග) ආයතනයේ භාවිතය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර මූලාශ්‍රවලින් ලැබෙන චංචල සහ නිශ්චල යන දෙයාකාරයෙන් ත්‍යාග, ප්‍රදාන, ණය, පරිත්‍යාග සහ රික්ථවරණ පිළිගැනීම සහ භාරගැනීම:

එසේ වුව ද, ආයතනයට ලබා දෙන ලද සියලු විදේශ ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ රික්ථවරණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමතය ආයතනය විසින් ලබා ගත යුතු ය;

(ච) මාධ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිමය ප්‍රමිති හඳුන්වා දීම, එම ප්‍රමිති සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම;

(ජ) ශ්‍රී ලංකාව තුළ මාධ්‍යයට අදාළ වන සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ට) ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය වෘත්තියේ ප්‍රගමනය පිළිබඳ පර්යේෂණ කරගෙන යාමට, මාධ්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන සාමාජිකයන්ට, නිලධරයන්ට, සේවානියුක්තයන්ට හෝ වෙනත් තැනැත්තන්ට සහාය වීම;

(ඩ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ රැස් කිරීම;

(ණ) ආයතනයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය සහ විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ත) ආයතනයේ සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යාම සහ එය ප්‍රකාශයට පත් කිරීම;

(ද) ආයතනයේ පරමාර්ථ සිදු කරගෙන යාමට හෝ ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට ආයතනය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි කමිටු, මණ්ඩල හෝ අනුකමිටු නිශ්චය කිරීම සහ පිහිටුවීම;

(න) එහි සේවානියුක්තයන් සඳහා සුබසාධන සහ විනෝදාත්මක පහසුකම් ස්ථාපනය කිරීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ප) සාමාජිකයන් අතර, වෘත්තිමය විනය පවත්වාගෙන යාම සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කිරීම; සහ

(බ) ආයතනයේ පරමාර්ථ සහ කර්තව්‍ය සිදුකරගෙන යාම සඳහා ආයතනයේ මතය පරිදි අවශ්‍ය හෝ යෝග්‍ය වන වෙනත් යම් සියලු ක්‍රියා හෝ දේවල් සිදු කිරීම,

සඳහා බලතල තිබිය යුතු ය.

II වන කොටස

**ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම**

ආයතනයේ සභාව සහ අතුරු සභාව

**5.** (1) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම (මේ පනතේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත සාමාජිකයන්ගෙන් සමන්විත වන ආයතනයේ පාලක සභාවක් වෙත පවරනු ලැබිය යුතු ය: -

(අ) මාධ්‍ය ක්ෂේත්‍රය තුළ සුදුසුකම්, දැනුම සහ පළපුරුද්ද සහිත ආයතනයේ සාමාජිකයන් අතරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් අට දෙනකු; සහ

(ආ) මාධ්‍ය ක්ෂේත්‍රය තුළ සුදුසුකම්, දැනුම සහ පළපුරුද්ද සහිත ආයතනයේ සාමාජිකයන් අතරින් පත් කරගනු ලබන සාමාජිකයන් හත් දෙනකු.

(2) ආයතනයේ සභාපතිවරයා සහ අනෙකුත් නිලධරයන්, 26 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව සභාවේ සාමාජිකයන් අතරින් තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, සභාව විසින්, මේ පනත මගින් ආයතනය වෙත පවරන ලද, නියම කරන ලද හෝ පනවන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, සිදු කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(4) (අ) අමාත්‍යවරයා විසින්, 26 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව සභාවේ සාමාජිකයන් තෝරා පත් කරගනු ලබන සහ පත් කරනු ලබන තෙක්, (මෙහි මින් මතු "අතුරු සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන අතුරු සභාවක් පත් කරනු ලැබිය යුතු ය:-

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා; සහ

(ii) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රත්‍යක්ෂ වූ දැනුම, විශිෂ්ටත්වය සහ අවම වශයෙන් වසර විස්සක පළපුරුද්ද සහිත ප්‍රකට තැනැත්තන් හය දෙනකු.

(ආ) අතුරු සභාවට පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් රීති සෑදීමට බලය තිබිය යුතු ය:-

(i) තෝරා ගත යුතු සාමාජිකයන් ගණන සහ ආයතනය වෙත එකී සාමාජිකයන් තෝරා ගනු ලබන නිර්ණායක පිළිබඳව; සහ

(ii) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන ප්‍රකාර, අතුරු සභාවට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ පත් කර ගැනීම.

(ඇ) අතුරු සභාව විසින්, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසරක කාලසීමාවක් ඇතුළත සභාවට සාමාජිකයන් තෝරා පත් කරගනු ලැබීම සහ පත් කරනු ලැබීම සිදු කළ යුතු ය.

සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය

**6.** (1) සභාවේ සෑම සාමාජිකයකු ම, මිය යාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම මඟින් ඔහු විසින් ධුරය කලින් පුරප්පාඩු

කරනු ලැබ ඇත්නම් මිස, ඔහුගේ තෝරා පත් කිරීමේ හෝ පත් කිරීමේ දින සිට වසර දෙකක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, නැවත තෝරා පත් කර ගැනීමට හෝ නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(2) සභාවේ යම් සාමාජිකයකු එක් ධුර කාලසීමාවකට වඩා වැඩි ගණනක් සභාවේ සභාපතිවරයා ලෙස පත් කිරීමට හෝ තෝරා පත් කර ගැනීමට සුදුස්සකු නොවිය යුතු ය.

(3) සාමාජිකයකුගේ මිය යාම, ඉල්ලා අස්වීම, ධුරයෙන් ඉවත් කිරීම හෝ වෙනත් යම් හේතුවක් නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, සභාව විසින්, 26 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව නිශ්චය කරන ලද සාමාජිකත්වය සඳහා වන සුදුසුකම් සැලකිල්ලට ගනිමින්, එකී පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත් කරගැනීම හෝ පත් කිරීම සිදු කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ තෝරා පත් කරගනු ලබන හෝ පත් කරනු ලබන තැනැත්තා විසින් එකී සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලසීමාව වෙනුවෙන් ධුරය දරනු ලැබිය යුතු ය.

(5) සභාවේ යම් සාමාජිකයකුට සභාපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මඟින් ඔහුගේ ධුරයෙන් ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්විය හැකි අතර එකී ඉල්ලා අස්වීම සභාපතිවරයා විසින් එය පිළිගැනීමෙන් පසු බලාත්මක විය යුතු ය.

(6) සභාවේ යම් සාමාජිකයකු සභාපතිවරයාගෙන් පූර්ව නිවාඩු ලබා ගැනීමෙන් තොරව සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණෙන අවස්ථාවක දී, එකී තුන්වන රැස්වීමේ දින සිට බලපැවැත්වෙන පරිදි එකී සාමාජිකයා විසින් ධුරය පුරප්පාඩු කර ඇති බවට සලකනු ලැබිය යුතු අතර 26 වන වගන්තිය යටතේ සාදනු ලබන සභාවේ රීතිවලට අනුකූලව එකී පුරප්පාඩුව පිරවීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ රැස්වීම්

**7.** (1) සභාපතිවරයා විසින් සභාවේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

(2) සභාවේ යම් රැස්වීමක ගණපූරණය සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(3) සභාවේ රැස්වීම් -

(අ) ඒ රැස්වීම සඳහා නියමිත ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්වන්නා වූ ගණපූරණයෙන් සමන්විත වන සාමාජිකයන් සංඛ්‍යාවකින්; හෝ

(ආ) සියලු සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් සහ ගණපූරණයෙන් සමන්විත වෙමින් එකවර එකී රැස්වීමේ කාලසීමාව තුළ දී සහභාගී වන එක් එක් සාමාජිකයා දැකීමට සහ ඇසීමට හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන ක්‍රමයක් මගින්,

යන දෙයාකාරයෙන් එක් ආකාරයකට පවත්වනු ලැබිය හැකි ය.

(4) සභාවේ යම් රැස්වීමක තීරණය සඳහා වන සියලු ප්‍රශ්න එවැනි රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. ඡන්දය සමාන වන අවස්ථාවක දී සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) (අ) සභාපතිවරයා විසින් සභාවේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය.

(ආ) සභාපතිවරයා සභාවේ යම් රැස්වීමකට නොපැමිණ ඇත්නම් උපසභාපතිවරයා විසින් එකී රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(ඇ) සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනාම යම් රැස්වීමකට නොපැමිණි අවස්ථාවක දී, පැමිණි සාමාජිකයන් විසින් රැස්වීමේ මුලසුන දැරීම සඳහා සාමාජිකයකු තෝරා පත් කර ගත යුතු ය.

(6) ආයතනයේ රැස්වීම්, සභාව විසින් 26 වන වගන්තිය යටතේ කලින් කලට සාදනු ලබන රීතිවලට අනුකූලව පැවැත්විය යුතු ය.

*යම් පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් සභාවේ ක්‍රියා හෝ නීති කෘත්‍ය බල රහිත සේ සලකනු නොලැබිය යුතු බව*

**8.** සභාවේ එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් හෝ සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතුවෙන් පමණක් සභාවේ යම් ක්‍රියාවක් හෝ නීතිකෘත්‍යයක් බලරහිත නොවිය යුතු ය, නැතහොත් බල රහිත යයි සලකනු නොලැබිය යුතු ය.

*ආයතනයේ මුද්‍රාව*

**9.** (1) ආයතනයේ මුද්‍රාව -

(අ) කලින් කලට සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) සභාවේ අවසරය ඇතිව සහ තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කළ යුතු සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(2) ආයතනයේ මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල සහ ලේඛනවල නාමලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

*සභාව විසින් රැස්වීම් සඳහා විශේෂඥයන්ට ආරාධනා කළ හැකි බව*

**10.** (1) සභාව විසින්, සභාවේ යම් රැස්වීමක දී සාමාජිකයන් විසින් සාකච්ඡා කරන ලද යම් කාරණාවක් පිළිබඳ විශේෂඥ මත ලබා ගැනීමේ අරමුණින් එකී රැස්වීමේ එකී යම් කාරණාව සම්බන්ධයෙන් විශේෂඥතාව දරන යම් විශේෂඥයකුට ආරාධනා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සභාවේ යම් රැස්වීමකට ආරාධනා කල විශේෂඥයන්ට කිසිදු ඡන්ද අයිතිවාසිකමක් නොතිබිය යුතු අතර, සභාවට එකී විශේෂඥයන්ගේ මත පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතයක් පැවතිය යුතු ය.

**සභාවේ රැස්වීම්වලට පැමිණීම සඳහා වන පාරිශ්‍රමික**

**11.** සභාවේ සාමාජිකයන්ට සහ විශේෂඥයන්ට, සභාව විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, සභාවේ රැස්වීම්වලට පැමිණීම වෙනුවෙන් 16 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආයතනයේ අරමුදලින් යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

**කමිටු පත් කිරීම**

**12.** (1) ආයතනය විසින් මේ පනතේ කර්තව්‍ය කරගෙන යාමේ කාර්යය උදෙසා පහත දැක්වෙන කමිටු පත් කරනු ලැබිය හැකි ය: -

(අ) ආයතනයේ සාමාජිකයන්ගේ සහ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ නිශ්චිතව දක්වනු ලබන යම් කාරණාවක් ක්‍රියාවට නංවනු ලැබිය හැකි ශාස්ත්‍රීය කමිටුවක්;

(ආ) ආයතනයේ පරිපාලනය සහ මූල්‍යය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ නිශ්චිතව දක්වනු ලබන යම් කාරණාවක් ක්‍රියාවට නංවනු ලැබිය හැකි මූල්‍ය හා පරිපාලන කමිටුවක්; සහ

(ඇ) ආයතනයේ සාමාජිකයකු සම්බන්ධයෙන් වන යම් විනය කාරණාවක් පිළිබඳව 23 වන වගන්තිය ප්‍රකාර පරීක්ෂණ පවත්වනු ලැබිය හැකි විනය කමිටුවක්.

(2) එකී කමිටුවල සංයුතිය, එකී කමිටුවල සාමාජිකයන්ගේ බලතල සහ කර්තව්‍ය සහ ඊට අදාළ වෙනත් යම් කාරණාවක්, 26 වන වගන්තිය යටතේ සභාව විසින් සාදනු ලබන රීති මගින් තීරණය කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන ඕනෑම කමිටුවක ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ-ජනරාල්වරයා කටයුතු කරනු ලැබිය යුතු ය.

**ආයතනයේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා**

**13.** (1) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ගණකාධිකාරි නිලධරයා විය යුතු (මේ පනතේ “අධ්‍යක්ෂ-ජනරාල්වරයා” යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ-ජනරාල්වරයකු සභාව විසින් පත් කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සභාවේ ලිඛිත අවසරය සහිතව, මේ පනත මගින් ඔහු වෙත පවරා ඇති හෝ පනවා ඇති හෝ නියම කර ඇති යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, එසේ සිදු කිරීම අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන්නේ නම්, සභාවේ යම් නිලධරයකුට හෝ සේවානියුක්තියකුට පවරනු ලැබිය හැකි අතර, එකී නිලධරයා හෝ සේවානියුක්තයා විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව එකී බලතලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ සිදු කිරීම කළ යුතු ය.

(3) අධ්‍යක්ෂ-ජනරාල්වරයා 14 වන වගන්තිය යටතේ ඔහු වෙත පවරා ඇති ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී සභාවට වගකිව යුතු අතර පිළිතුරු දීමට බැඳී සිටිය යුතු ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා රෝගාතුර වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට ඔහුට නොහැකිවන අවස්ථාවක දී, සභාව විසින්, එකී නොපැමිණීමේ කාලසීමාව තුළ දී ඔහු වෙනුවට කටයුතු කිරීමට ආයතනයේ වෙනත් නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ - ජනරාල්වරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**14.** අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව -

(අ) සභාවේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය;

(ආ) සභාවේ සාමාන්‍ය සහ විශේෂ විධානයන්ට සහ පාලනයට යටත් ව, කාර්ය මණ්ඩල පරිපාලනය සහ පාලනය ඇතුළුව ආයතනයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් භාරව කටයුතු කළ යුතු ය;

(ඇ) සභාව විසින් ඔහු වෙත පවරනු ලැබිය හැකි පරිදි සියලු කර්තව්‍ය කරගෙන යනු ලැබිය යුතු ය; සහ

(ඈ) සභාවේ සහ 12 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන කමිටුවල ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය සහ පාරිශ්‍රමික

**15.** (1) තාක්ෂණික සහ කුසලතා සහිත කාර්ය මණ්ඩලයකින්, පරිපාලන සහ කළමනාකාර කාර්ය මණ්ඩලයකින් සහ ආයතනය විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි පරිදි වෙනත් යම් තැනැත්තන් ද ඇතුළු ව ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය කරන නිලධරයන් සහ සේවානියුක්තයන් යම් සංඛ්‍යාවක් ආයතනය විසින් සේවයේ නියුක්ත කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයාට සහ ආයතනයේ කාර්ය මණ්ඩලයට, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, යම් ආකාරයකින් සහ යම් ප්‍රමාණයකින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

## III වන කොටස

## ආයතනයේ අරමුදල

ආයතනයේ අරමුදල

**16.** (1) ආයතනයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) ආයතනයේ අරමුදලට -

(අ) මේ පනත යටතේ ආයතනය විසින් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී ආයතනයට ලැබිය හැකි සියලු මුදල්; සහ

(ආ) 4 වන වගන්තියේ (ග) ඡේදයේ අතුරු වගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර ඕනෑම මූලාශ්‍රයකින් ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග සහ රික්ථවරණ ආකාරයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ සිදු කිරීමේ දී සභාව විසින් දරනු ලබන යම් වියදමක් පියවා ගැනීමට අවශ්‍ය කරන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**17.** (1) ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

(2) ආයතනය විසින් එහි ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ ආයතනයේ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ ගිණුම්, විගණකාධිපතිවරයා හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය ප්‍රකාර, විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් හෝ වාර්ෂිකව විගණනය කළ යුතු අතර, විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් පත් කරනු ලබන එකී සුදුසුකම්ලත් විගණකවරයා විසින් එම ගිණුම් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය මඟින් එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

## IV වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

**18.** (1) ආයතනය විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක් ඇතුළත, ආයතනය විසින් එම මුදල් වර්ෂය තුළ කරගෙන යන ලද කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ වාර්තාවට පහත දැක්වෙන ලේඛන අමුණනු ලැබිය යුතු ය:-

වාර්ෂික වාර්තාව

(අ) සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද මුදල් වර්ෂය සඳහා වන ආයතනයේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය;

(ආ) ආයතනය විසින් එළඹුණු සියලු කොන්ත්‍රාත් සහ ගිවිසුම් පිළිබඳ වාර්තාවක්; සහ

(ඇ) එකී වාර්තාව සහ ගිණුම් අදාළ වන්නා වූ වර්ෂයට ඉක්බිතිව ම වූ පසු වර්ෂය සඳහා යෝජිත කටයුතුවල වාර්තාවක්.

(2) මුදල් වර්ෂය තුළ දී ආයතනයට ලැබුණු විදේශීය සහ දේශීය මුදල්වලට අදාළ වෙනම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට අමුණනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, වාර්ෂික වාර්තාව ලැබුණ දින සිට මාස තුනක් ඇතුළත දී, (1) වන සහ (2) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති ලේඛන ද සමග එකී වාර්තාව අවම වශයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලබන දෛනික පුවත්පත් තුනකවත් පළ කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, එය සලකා බැලීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

රහස්‍යතා ප්‍රකාශය

**19.** සභාවේ සාමාජිකයන් සහ ආයතනයේ නිලධරයන් සහ සේවානියුක්තිකයන් විසින්, ස්වකීය කාර්ය සඳහා එළඹීමට පෙරාතුව, ආයතනයේ වැඩවලට සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යභාවය සුරකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර, ඔවුන්ගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී -

(අ) අධිකරණයක් විසින් එසේ කිරීමට නියම කරන විට; හෝ

(ආ) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ යම් විධිවිධානයකට අනුකූල වීමේ දී හැර,

ඔවුන් විසින් දැනුවත් වූ කිසිදු කාරණයක් හෙළිදරව් නොකරන බවට එකී ප්‍රකාශයෙන් පොරොන්දු විය යුතු ය.

ආයතනයේ බලතල පැවරීම

**20.** සභාව විසින්, සභාව වෙත පවරන ලද හෝ නියම කරන ලද යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට, කිරීමට හෝ ඉටු කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ ආයතනයේ යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට එම නිලධරයා හෝ සේවානියුක්තයාගේ කැමැත්ත සහිතව පවරනු ලැබිය හැකි ය. ආයතනය විසින්, එකී පැවරීම නොතකා, එසේ

පවරන ලද එකී බලතලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකි ය.

දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව ආයතනය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**21.** ආයතනය, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

වියදම් ප්‍රතිපූරණය කිරීම

**22.** (1) යම් අධිකරණයක් ඉදිරියේ ආයතනය විසින් හෝ ආයතනයට එරෙහිව ඉදිරිපත් කළ යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් වෙනුවෙන් ආයතනය විසින් දරන ලද යම් වියදමක් ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තකින් ආයතනයට ගෙවන ලද හෝ ආයතනය විසින් අයකරගත් යම් මුදලක් ආයතනයේ අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ ආයතනයේ විධානය මත සිදු කරන ලද හෝ කිරීමට අරමුණු කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඒ තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එකී ක්‍රියාව සද්භාවයෙන් සිදු කළ ක්‍රියාවක් බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, එකී තැනැත්තා විසින් එකී සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තේ දී ඒ වියදම අය කරගෙන ඇත්නම් මිස, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විනය කමිටුව විසින් පරීක්ෂණ පැවැත්වීම

**23.** (1) මේ පනතේ 12 වන වගන්තිය යටතේ පත් කරන ලද විනය කමිටුව විසින්, ආයතනයේ සාමාජිකයකුගේ වෘත්තිමය විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනය විසින් විනය කමිටුව වෙත යම් කාරණාවක් යොමු කරනු ලබන ඕනෑම අවස්ථාවක දී, පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා, “වෘත්තිමය විෂමාචාර ක්‍රියාවක්” යන්නෙන්, 26 වන වගන්තිය යටතේ සභාව විසින් සාදනු ලබන රීති මඟින් නිශ්චය කරනු ලැබිය යුතු යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අදහස් වේ.

(3) විනය කමිටුව විසින්, (1) වන උපවගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, එකී සාමාජිකයා වෘත්තිමය විෂමාචාර ක්‍රියාවකට වරදකරු වී තිබේද නැද්ද යන්න පිළිබඳව නිශ්චිතව දක්වමින් පරීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු මත පදනම් වූ වාර්තාවක් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

වෘත්තිමය විෂමාචාර ක්‍රියා වෙනුවෙන් නම ලියාපදිංචියෙන් ඉවත් කිරීම

**24.** 23 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විනය කමිටුවේ වාර්තාව මඟින් ආයතනයේ යම් සාමාජිකයකු වෘත්තිමය විෂමාචාර ක්‍රියාවකට වරදකරු වී ඇති බවට තහවුරු කරන්නේ නම් සභාව විසින් එකී සාමාජිකයාගේ නම ලියාපදිංචියෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, (1) වන උපවගන්තිය යටතේ සාමාජිකයකුගේ නම ලියාපදිංචියෙන් ඉවත් කිරීම වෙනුවට සභාව විසින් අනතුරු ඇඟවීම, අවවාද කිරීම හෝ වසරකට නොවැඩි යම් කාලසීමාවක් සඳහා ඔහුගේ සාමාජිකත්වය අත්හිටුවීම සිදු කළ හැකි ය:

එසේ ම තවදුරටත්, එකී තැනැත්තා ආයතනයේ සාමාජිකයකු බවට පත් වී මාධ්‍ය වෘත්තිකයකු ලෙස කටයුතු කිරීමට සුදුසු බවට සභාවේ මතය වන්නේ නම් සභාව විසින් එහි අභිමතය පරිදි එකී තැනැත්තාගේ නම නැවත ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

නියෝග

**25.** (1) අමාත්‍යවරයා විසින්, 7 වන වගන්තිය ප්‍රකාර සභාවේ රැස්වීමක දී ලබා ගනු ලබන සභාවේ එකඟත්වය සහිතව, මේ පනත මඟින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ පනතින් නියෝග සෑදීමට අවශ්‍ය වන හෝ බලය දී ඇති ඕනෑම කාරණාවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත දී අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ යටතේ පූර්වයෙන් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**26.** (1) සභාව විසින් ආයතනයේ යම් මහා සභා රැස්වීමක දී සහ පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයක් මඟින්, පහත දැක්වෙන කාරණා සියල්ල හෝ කිසිවක් සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන හා අනනුකූල නොවන පරිදි, කලින් කලට රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:- රීති

(අ) සභාවේ සාමාජිකයන් තෝරා පත් කරගැනීම හෝ පත් කිරීම සහ එකී සාමාජිකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ආ) සභාවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම්වල දැන්වීම් සහ න්‍යාය පත්‍ර සහ එහි කටයුතු පැවැත්වීම;

(ඇ) සාමාජිකයන් බඳවා ගැනීම සහ ඉන් ඉවත් කිරීම, ආයතනයේ සාමාජිකත්වය සඳහා වන සුදුසුකම් සහ නුසුදුසුකම්, සාමාජිකයන් වර්ගීකරණය, සාමාජික ගාස්තු සහ එයට අදාළ වෙනත් ඕනෑම කාරණාවක්;

(ඈ) ආයතනයට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම;

(ඉ) අධ්‍යයන පාඨමාලා සහ විභාග සඳහා අය කළ යුතු ගාස්තු;

(ඊ) ආයතනයේ අධ්‍යයන පාඨමාලා, ප්‍රායෝගික පුහුණු පාඨමාලා සහ විභාගවලට අදාළ ඕනෑම කාරණාවක්;

(උ) මේ පනත යටතේ සභාවට ඉදිරිපත් කළ යුතු ඉල්ලුම්පත්‍රවල ආකෘති සහ ආකාරය;

(ඌ) ආයතනයේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය; සහ

(එ) මේ පනත මඟින් රීති සෑදීමට බලය දෙන ලද හෝ අවශ්‍ය වන කාරණා සියල්ල හෝ කිසිවක්.

(2) ආයතනය විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් ලෙස, එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එයට එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති, එම රීති සෑදීමෙන් පසු මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) ආයතනය විසින් සාදනු ලබන සෑම රීතියක් ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් රීතියක්, ඒ යටතේ පූර්වයෙන් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ එසේ යම් රීතියක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**27.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ - අර්ථ නිරූපණය

"මාධ්‍ය වෘත්තිකයන්" යන්නට, මාධ්‍ය ක්ෂේත්‍රයේ ලේඛකයන්, අන්තර්ගතය තනන්නන්, අන්තර්ගත සංස්කාරකවරුන්, නිවේදකයන්, ඉදිරිපත් කරන්නන්, මාධ්‍ය විකාශකයන්, පුවත්පත් කලාවේදීන්, සංස්කාරකවරුන්, ප්‍රකාශකයන්, මාධ්‍ය හිමිකරුවන්, මාධ්‍ය කළමනාකරුවන්, මාධ්‍ය අධ්‍යාපනය ලබා දෙන තැනැත්තන්, මාධ්‍ය පර්යේෂකයන්,

මාධ්‍ය තාක්ෂණවේදීන් සහ ඡායාරූප ශිල්පීන් ද ඇතුළත් වේ;

“අමාත්‍යවරයා” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන වගන්තියේ හෝ 45 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාධ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ; සහ

“ලිඛිත නීතිය” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ඒ පදයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**28.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.